සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..................
දිනය / திகதி / Date: 2020.12.24

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2017/14 ට පළමු එකතුව**

සියළුම සමෘද්ධි බැංකුපාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති කළමණාකරුවන් ,

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකයින්ට ණය ලබාදීම සඳහා බැංකු සමිති වෙත ලබාදෙන ප්‍රතිමූල්‍ය ණය (පණ) වැඩසටහන</u>

01. ප්‍රජමූල බැංකු අංශය විසින්, බැංකු සමිති හරහා සමෘද්ධි බැංකු සඳහා ලබාදෙන ප්‍රතිමූල්‍ය ණය සහ "සමෘද්ධි ඉසුරු" ණය සඳහා ලබාදෙන ප්‍රතිමූල්‍ය ණයවලට අදාල වූ වාර්ෂික පොලී අනුපාතයන් ඇතුළු ප්‍රතිමූල්‍ය ණය වැඩසටහන අදාල වූ කරුණු සම්බන්ධ ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තීරණ අංක 2020/75/04 අනුව සිදු කරන සංශෝධනයන් දැනුම්දීම සඳහා මෙම නව එකතුව නිකුත් කරන බව දැනුම්දෙමි.

02. සංශෝධිත වාර්ෂික පොලී අනුපාතයන්

2.1 ප්‍රතිමූල්‍ය ණය ලබාදෙන නව වාර්ෂික පොලී අනුපාතයන් පහතවේ.

| ප්‍රතිමූල්‍ය ණය ලබාදෙන ආයතනය | ප්‍රතිමූල්‍ය ණය ලබා ගන්නා ආයතනය | සංශෝධිත වාර්ෂික පොලී අනුපාතය |
|---|---|---|
| ප්‍රජාමූල බැංකු අංශය | ප්‍රජාමූල බැංකු සමිතිය | 6% |
| ප්‍රජාමූල බැංකු සමිතිය | ප්‍රජාමූල බැංකුව | 7% |

2.2 ප්‍රතිමූල්‍ය ණය වැඩසටහන මඟින් ණය පහසුකම් ලබාගෙන, බැංකු සාමාජිකයින්ට ලබාදෙන ණය සඳහා වූ වාර්ෂික පොලී අනුපාතයන් නිකුත් කර ඇති ණය චක්‍රලේඛ උපදෙස්වල සඳහන් පරිදි බව දන්වමි.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

2.3 "සමෘද්ධි ඉසුර ණය වැඩසටහන" යටතේ ණය ලබාදීමට ප්‍රජමුල බැංකු අංශය විසින්, බැංකු සමිතියට ලබාදෙන ප්‍රතිමුල්‍ය ණය සඳහා බල පවත්වන වාර්ෂික පොලි අනුපාත දී ඇති ණය උපදෙස්වල සඳහන් පරිදි බව ද දන්වමි.

2.4 නව වාර්ෂික පොලි අනුපාතයන් 2020.12.15 දින සිට බලපවත්වන බව ද දන්වමි.

03. චක්‍රලේඛ අංක 2017/14 හි ඡේද, අංක 2 හි උපඡේද අංක 2.1 අවලංගු කරන අතර, මින් ඉදිරියට ඡේද අංක 02 හි අනිකුත් උප ඡේදයන්හි සඳහන් සුදුසුකම් සපුරා ඇති ඉහල කාර්යක්ෂමතාවයකින් හෙබි සමෘද්ධි බැංකු සඳහා ප්‍රතිමුල්‍ය ණය පහසුකම් ලබාගැනීමට අවස්ථාව පුළුල් කරන බවත් දන්වමි.

04. සමෘද්ධි ඉසුර ණය වැඩසටහන සඳහ, අවශ්‍ය ප්‍රතිමුල්‍ය ණය ඉල්ලුම් කිරිමේදී දිවිනැගුම ප්‍රජාමුල බැංකු ණය වැඩසටහන චක්‍රලේඛ අංක 2014/07 ට පළමු එකතුවේ ඡේද අංක 15.4 හි ඇමුණුම් භාවිතා කළ යුතුය.

05. සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක 2017/14 ට සිදු කරන ලද සංශෝධන මෙපමණ වන අතර, අනිකුත් උපදෙස් සඳහා මෙහෙයුම් උපදෙස් 09 සහ ඊට එකතුන් සහ චක්‍රලේඛ අංක 2017/14 සඳහන් උපදෙස් තවදුරටත් වලංගු බව ද දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
7. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.